FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

2021 දෙසැම්බර්

කලාප අංක 12



රංජන් රාමනායකගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇතැයි අන්තර් පාර්ලිමේන්තු සංගමය තීරණය කරයි



අදහස් ප්‍රකාශ කිරීමක් හේතුවෙන් අත්අඩංගුවට ගත් අසාත් සාලි නිදොස් කොට නිදහස් කරයි



අහ්නාෆ් ජසීම් කවියාට මාස 18කට පසු ඇප නියම කරයි

## අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට එරෙහි බාධක ජයගනිමු

**'මානව නිදහස පිළිබඳ දර්ශකයේ විශාලතම පරිහානිය අත්විඳි දර්ශකය වන්නේ ප්‍රකාශනයේ නිදහසයි'**

**- CATO Institute -2021 Human Freedom Report, 29 පිටුව**

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස විවිධාකාරයෙන් භුක්තිවිඳීම සඳහා මිනිසාට ඇත්තේ අනුල්ලංඝනීය අයිතියකි. එමගින් ගුණාත්මක ජීවිතයකට තිබෙන අයිතිය පමණක් නොව සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදය ද සහතික කෙරේ. පසුගිය වසර තුළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, සමාගමයේ නිදහස හා මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳ කරනු ලැබූ නිරීක්ෂණයන් 100කට ආසන්න ප්‍රමාණය පරීක්ෂා කර බැලීමේ දී පෙනී යන වැදගත් කරුණක් වන්නේ ශ්‍රී ලංකික පුරවැසියන්ට ද සිය අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස භුක්ති විඳීම සම්බන්ධයෙන් ගැටලු රැසක් පවතින බවයි. විශේෂයෙන් කොවිඩ් දැඩි වසංගත තත්ත්වය හා වර්ධනය වන සමාජ ආර්ථික අර්බුදය හමුවේ පුරවැසියන් සතු අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය උල්ලංඝනය කිරීමේ ප්‍රයත්නයන් ක්‍රියාත්මක වන අයුරු නිරීක්ෂණය කළ හැකිය.

පවතින නීති අවභාවිත කිරීම මගින් මෙම උල්ලංඝනයන් සිදු කිරීම ආණ්ඩුවේ උපාය මාර්ගය වී තිබේ. එසේ අවභාවිතය සඳහා සුලබව යොදා ගැනෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය දිගින් දිගටම ඉල්ලා සිටින්නේ ඒ නිසාය. එසේම ජනතාවගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සහතික කරන 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සී.පී.ආර්) පනත ද අවභාවිත කිරීමෙන් වළකින ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය නැවත නැවතත් අවධාරණය කර තිබේ. එළඹෙන 2022 නව වසර එම බාධක ජය ගැනීම සඳහා කැප වන වසරක් බවට පත් කර ගැනීම මානව නිදහස අගයන සැමගේ පොදු වගකීමකි.

**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම් හා ජාත්‍යන්තර ප්‍රජාව දක්වන ප්‍රතිචාර කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරා ගෙන ඇති විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 16ක් 2021 දෙසැම්බර් මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 3ක්, මාධ්‍යයෙහි ස්වාධීනත්වයට අදාළ සිදුවීම් 1ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 6ක්, ව්‍යුහාත්මක කොන්දේසි යටතට ගැනෙන සිදුවීම් 5ක් සහ වෘත්තීයවේදීත්වයට අදාළ සිදුවීම් 1ක් ඒ අතර වෙයි.**

## දෙසැම්බර් මාසය තුළ වාර්තා වූ සිදුවීම්

1. රංජන් රාමනායක මන්ත්‍රීවරයා විසින් කරන ලද ප්‍රකාශයක් නිසා ඔහුට සිර දඬුවම් නියම කිරීම හේතුවෙන් ඔහුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇතැයි අන්තර් පාර්ලිමේන්තු සංගමය තීරණය කිරීම.
2. රිෂාඩ් බදුර්දීන් මන්ත්‍රීවරයා අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අන්තර් පාර්ලිමේන්තු සංගමයේ දැඩි අවධානය යොමු වීම.
3. පොලිස් නිලධාරීන්ගෙන් සිදු වූ අකටයුත්තක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට ගිය උදයන් පුවත්පතේ ජේදුරුතුඩුව වාර්තාකරු ජයචන්ද්‍රන් සුලක්ෂන්ට ජේදුරුතුඩුව පොලිස් ස්ථානාධිපතිවරයා තර්ජනය කිරීම.
4. ප්‍රවෘත්ති සාකච්ඡාවකදී කළ ප්‍රකාශයක් හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා ICCPR පනත යටතේ චූදිතයකුව සිටි හිටපු ආණ්ඩුකාර අසාත් සාලි මහාධිකරණය මගින් නිදොස් කොට නිදහස් කිරීම.
5. කාව්‍ය සංග්‍රහයක් පළ කිරීම හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 18ක කාලයක් රඳවාගෙන සිටි අහ්නාෆ් ජසීම්ට මහාධිකරණය මගින් ඇප නියම කිරීම.
6. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන සිටින සියලුම සිරකරුවන් පිළිබඳව විස්තර ලබා දෙන ලෙස මානව හිමිකම් ක්‍රියාධරයන් පිරිසක් තොරතුරු පනත යටතේ නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටීම.
7. ජාත්‍යන්තර මානව හිමිකම් දිනය නිමිත්තෙන් මහනුවර මානව හිමිකම් කාර්යාලය මගින් පැවැත්වීමට නියමිතව තිබූ සමරු රැස්වීම, පොලිසිය අධිකරණයෙන් ලබා ගත් නියෝගයක් මත තහනම් කිරීම.
8. ජාතික මානව හිමිකම් කොමිෂන් සභා සඳහා වන එක්සත් ජාතීන්ගේ ආයතනය (GANHRI) විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම A ශ්‍රේණියේ සිට B ශ්‍රේණිය දක්වා පහත හෙළීම.
9. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවේ පසුවන ලංකා ඊ නිව්ස් මාධ්‍යවේදී කීර්ති රත්නායක ජනවාරි 15 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය නියෝග කිරීම.
10. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මූලිකත්වයෙන් 'ඉහළ වෘත්තීය පරිචයකින් යුත් ඩිජිටල් මාධ්‍යකරණයක් සඳහා වන ආචාරධර්ම උදෙසා මූලික එකඟතාවක් ඇති කර ගැනීම සහ ඩිජිටල් මාධ්‍යවේදීන් සංවිධාන ගත කිරීමේ වැඩපිළිවෙළක්' ආරම්භ කිරීම.
11. තොරතුරු කොමිසමේ සභාපතිවරයා ලෙස විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න පත් කිරීමට විරෝධය පළ කරමින් සිවිල් සංවිධාන 9ක් නිවේදනයක් නිකුත් කිරීම.
12. තොරතුරු කොමිසමේ නියෝගය ක්‍රියාත්මක නොකළ පොලිස් මූලස්ථානයේ හා පොලිස් අධිකාරී කාර්යාල 03ක නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස තොරතුරු කොමිසම පොලිස් මූලස්ථානයට දැනුම් දීම.
13. අනිද්දා පුවත්පතේ නියෝජ්‍ය ප්‍රධාන කර්තෘ සහ ප්‍රවෘත්ති කර්තෘ ලසන්ත රුහුණගේගේ කටයුතු රාජ්‍ය ඔත්තු සේවාවල ආවේක්ෂණයට ලක් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය පොලිස්පතිවරයාගෙන් ඉල්ලා සිටීම.
14. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට කළ පැමිණිල්ලක් ඉවත් කරගන්නා ලෙස බලකරමින් අක්කරෙයිපත්තු පොලිසියේ නිලධාරියෙක් නිදහස් මාධ්‍යවේදී අබ්දුල් රහීම් සහීර් අහමඩ්ට තර්ජනය කිරීම.
15. ලේක්හවුස් ආයතනයේ ඩිජිටල් මාධ්‍ය ප්‍රධානී මංජුල සමරසේකරගේ සේවය හේතු දැක්වීමකින් තොරව අත්හිටුවීම සම්බන්ධයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ජනමාධ්‍ය ඇමතිවරයා වෙත ලිපියක් යොමු කිරීම
16. අසභ්‍ය ප්‍රකාශන තහනම් කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව දෙසැ 27 වැනිදා නිකුත් කළ ගැසට් නිවේදනය, අධිකරණ ඇමතිවරයාගේ උපදෙස් පරිදි බල රහිත කිරීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2021 දෙසැම්බර්**

| අංකය | ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 03 |
| 02 | මාධ්‍යයේ ස්වාධීනත්වය | 01 |
| 03 | නීතිමය කොන්දේසි | 06 |
| 04 | ව්‍යුහාත්මක කොන්දේසි | 05 |
| 05 | වෘත්තීයවේදීත්වය | 01 |
| | **එකතුව** | **16** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 3ක් දෙසැම්බර් මාසයේදී වාර්තා විය.**

**2 වගුව: 2021 දෙසැම්බර්: මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 03**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මානසික බලපෑම් | 03 |
| | **එකතුව** | **03** |

1. **පොලිස් නිලධාරීන්ගෙන් සිදු වූ අකටයුත්තක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට ගිය උදයන් පුවත්පතේ ජේදුරුතුඩුව වාර්තාකරු ජයචන්ද්‍රන් සුලක්ෂන්ට ජේදුරුතුඩුව පොලිස් ස්ථානාධිපතිවරයා තර්ජනය කිරීම.**

   පොලිස් නිලධාරීන්ගෙන් සිදු වන අකටයුත්තක් පිළිබඳව කඩහිමියකු විසින් ලබා දුන් තොරතුරක් ගැන මාධ්‍යවේදියා අදාළ පොලිස් නිලධාරීන්ගෙන් කරුණු විමසීමේදී ඇති වූ බහින්බස්වීමක් සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයාට පැමිණිලි කිරීමට ගිය අවස්ථාවේදී මෙම තර්ජනය සිදු කර ඇත. යාපනය මාධ්‍ය සමාජය උපුටා දක්වමින් ලීඩර් වෙබ් අඩවිය සඳහන් කරන්නේ මෙහිදී මාධ්‍යවේදියාට මරණීය තර්ජන සිදු කර ඇති බවයි.

   මූලාශ්‍රය: https://theleader.lk

2. **අනිද්දා පුවත්පතේ නියෝජ්‍ය ප්‍රධාන කර්තෘ සහ ප්‍රවෘත්ති කර්තෘ ලසන්ත රුහුණගේගේ කටයුතු රාජ්‍ය ඔත්තු සේවාවල ආවේක්ෂණයට ලක් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය පොලිස්පතිවරයාගෙන් ඉල්ලා සිටීම.**

   අනිද්දා පුවත්පතේ නියෝජ්‍ය කර්තෘ සහ ප්‍රවෘත්ති කර්තෘ ලසන්ත රුහුණගේ පසුපස රාජ්‍ය ඔත්තු සේවා លුහුබඳිමින් සිටින බවට සැක පළ කරන වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, ඒ සම්බන්ධයෙන් වහා පරීක්ෂණයක් පවත්වන්නැයි පොලිස්පතිවරයාගෙන් ඉල්ලා ඇත.

   ජනමාධ්‍ය ඇමතිවරයාටද පිටපතක් සහිතව පොලිස්පති සී.ඩී වික්‍රමරත්න වෙත ලිපියක් යවමින් එම සංගමය සඳහන් කරන්නේ, 0773037462 දරන දුරකතනයෙන් දිගින් දිගටම මගහැරුණු ඇමතුම් ලබා දෙමින් මාධ්‍යවේදී ලසන්ත රුහුණගේට අදාළ භෞම ස්ථාන ආවේක්ෂණ සිදු කරන බවට සැකයක් ඇති බවයි.

   මූලාශ්‍රය: https://www.citizen.lk

3. **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට කළ පැමිණිල්ලක් ඉවත් කරගන්නා ලෙස බලකරමින් අක්කරෙයිපත්තු පොලිසියේ නිලධාරියෙක් නිදහස් මාධ්‍යවේදී අබ්දුල් රහීම් සහීර් අහමඩ්ට තර්ජනය කිරීම.**

   පසුගිය සැප්තැම්බර් මාසයේදී පොලිසිය සිදු කළ පහරදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට කළ පැමිණිල්ල ඉවත් කර ගන්නා ලෙස බල කරමින්, සිවිල්

ඇඳුමින් පැමිණි පොලිස් නිලධාරියෙක් මාධ්‍යවේදියාට තර්ජනය කර තිබේ.

රාජකාරි කටයුත්තක් සඳහා නිවසෙන් පිටවෙද්දී මුහුණ ආවරණය නිසි ලෙස පැළඳ නොසිටි බවට චෝදනා කරමින් සැප්තැම්බර් 2 දා පොලිස් නිලධාරීන් කිහිප දෙනකු ඔහුට පහර දී කැමරාවට හානි සිදු කිරීම සම්බන්ධයෙන් මාධ්‍යවේදියා මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් කර තිබුණි.

මූලාශ්‍රය: https://theleader.lk

## මාධ්‍යයේ ස්වාධීනත්වය

**'මාධ්‍යයේ ස්වාධීනත්වය' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන තවත් එක් වැදගත් සංරචකයකි. මාධ්‍ය ආයතනයක් තුළ මාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වය, විදෙස් මාධ්‍යවල කර්තෘ මණ්ඩල ස්වාධීනත්වය, දේශපාලනඥයින්ගේ, ව්‍යාපාරිකයන්ගේ සහ ආගමික බලපෑම්, වෙළෙඳ දැන්වීම් දූෂණය හෝ සහනාධාර ඔස්සේ මාධ්‍යයේ අන්තර්ගතයට බලපෑම් කිරීම, අන්තර්ජාල පහසුකම් සලසන්නා මගින් අන්තර්ගතයට බලපෑම් කිරීම යනාදී දර්ශක නවයක් ඔස්සේ ඒ පිළිබඳව සලකා බැලේ. මෙම සංරචකය යටතට ගැනෙන එක් සිදුවීමක් දෙසැම්බර් මාසයේදී වාර්තා විය.**

**3 වගුව: 2021 දෙසැම්බර්: මාධ්‍යයේ ස්වාධීනත්වය - සිදුවීම් 01**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මාධ්‍ය ආයතනයක් තුළ මාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වය/ දේශපාලන බලපෑම් | 01 |
| | **එකතුව** | **01** |

1. **ලේක්හවුස් ආයතනයේ ඩිජිටල් මාධ්‍ය ප්‍රධානී මංජුල සමරසේකරගේ සේවය හේතු දැක්වීමකින් තොරව අත්හිටුවීම සම්බන්ධයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ජනමාධ්‍ය ඇමතිවරයා වෙත ලිපියක් යොමු කිරීම.**

   ලේක්හවුස් මානව සම්පත් අධ්‍යක්ෂවරයාගේ 2021 නොවැම්බර් 25 දිනැති ලිපියක් මගින් මංජුල සමරසේකර වෙත මෙම වැඩ තහනම් කිරීම දැනුම් දී ඇති අතර ඒ සඳහා කිසිදු හේතුවක් සඳහන් කර නොමැති බවත්, මාධ්‍යවේදියා විසින් අදාළ පියවරට හේතු විමසමින් පාලනාධිකාරිය වෙත යොමු කරන ලද ලිපියට මසක් ගත වන තුරුත් පිළිතුරක් ලබා දී නොමැති බවත් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මාධ්‍ය ඇමතිවරයාගේ අවධානයට යොමු කර තිබේ.

   රාජ්‍ය මාධ්‍ය ආයතනයක් අවම සේවක අයිතීන් හෝ නොතකා කටයුතු කිරීම කනගාටුදායක තත්ත්වයක් බව අවධාරණය කරන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, සිදු වී ඇති අසාධාරණය සම්බන්ධයෙන් යුක්තිය ඉටු කරන මෙන් ජනමාධ්‍ය ඇමතිවරයාගෙන් ඉල්ලා සිටී.

   මූලාශ්‍රය: එම නිවේදනය

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 6ක් දෙසැම්බර් මාසය තුළ නිරීක්ෂණය විය. ප්‍රවෘත්ති සාකච්ඡාවකදී කළ අදහස් පළ කිරීමක් හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා ICCPR පනත යටතේ හිටපු ආණ්ඩුකාරවරයකු වූ අසාත් සාලිට එරෙහිව පවරා තිබූ නඩුවෙන් ඔහු නිදොස් කොට නිදහස් කිරීම, රජය අදාළ පනත් අවභාවිත කිරීම පිළිබඳව ප්‍රබල නිදර්ශනයකි. නිර්මාණ කෘතියක් පළ කිරීම හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 18ක් රැඳවුම් භාරයේ තබාගෙන සිටි අහ්නාෆ් ජසීම්ට මහාධිකරණය මගින් ඇප නියම කරන ලදි.**

**4 වගුව: 2021 දෙසැම්බර්: නීතිමය කොන්දේසි- සිදුවීම් 06**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීතිමය ක්‍රියාමාර්ග | 04 |
| 02 | නීති ප්‍රතිසංස්කරණ යෝජනා | 01 |
| 03 | තොරතුරු දැනගැනීමේ අයිතිය | 01 |
| | **එකතුව** | **06** |

1. **ප්‍රවෘත්ති සාකච්ඡාවකදී කළ ප්‍රකාශයක් හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා ICCPR පනත යටතේ චූදිතයකුව සිටි හිටපු ආණ්ඩුකාර අසාත් සාලි මහාධිකරණය මගින් නිදොස් කොට නිදහස් කිරීම.**

   ඉහත පනත් යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අසාත් සාලිට එරෙහිව ගොනු කර තිබූ චෝදනාවලට ඔහු නිවැරදිකරු බව තීරණය කළ කොළඹ මහාධිකරණ විනිසුරුවරයා ඔහු නිදොස් කොට නිදහස් කිරීමට නියෝග කළේය.

   2021 මාර්තු 09 වැනිදා ප්‍රවෘත්ති සාකච්ඡාවකදී පළ කළ අදහස් මගින් 'ආගමික කණ්ඩායම් අතර එදිරිවාදිකම් ඇති කිරීමේ' චෝදනාව මත මාර්තු 16 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අසාත් සාලි අත්අඩංගුවට ගත් අතර නඩුව අවසන් වන තුරු බන්ධනාගාරගතව සිටීමට ඔහුට සිදු විය.

   මේ පිළිබඳව මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කළේ, මෙම නඩු තීන්දුව 'නීතිය අවභාවිත කිරීමට දේශපාලන අධිකාරීන් උත්සාහ දරන අන්දම පෙන්වා දෙන අවස්ථාවක්' බවයි.

   මූලාශ්‍ර: 1. http://www.dinamina.lk
   2. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ නිවේදනය

2. **කාව්‍ය සංග්‍රහයක් පළ කිරීම හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස 18ක කාලයක් රඳවාගෙන සිටි අහ්නාෆ් ජසීම්ට මහාධිකරණය මගින් ඇප නියම කිරීම.**

   2020 මැයි මස 16 වැනිදා සිට අත්අඩංගුවේ පසුවූ අහ්නාෆ් ජසීම්ට 2021 දෙසැම්බර් 15 වැනිදා පුත්තලම මහාධිකරණය විසින් ඇප නියම කෙරිණි. මසකට දෙවරක් පුත්තලම පොලිසියේ පෙනී සිටීම, විදේශගත වීම තහනම් කිරීම ඇප කොන්දේසි වේ. අත්අඩංගුවට ගැනීමෙන් ඔහුගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවට ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම දෙසැම්බර් 08 වැනිදා කැඳවූ අවස්ථාවේදී, ඔහුට ඇප දීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බව නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී තිබිණි.

   අධිකරණයක් ඉදිරියේ චෝදනා ගොනු කිරීමකින් තොරව වසරකට අධික කාලයක් රඳවා තබාගෙන සිටි අහ්නාෆ් ජසීම් 2021 මැයි 12 වැනිදා අධිකරණය වෙත ඉදිරිපත් කෙරුණු අතර 2021 ඔක්තෝබර් 10 වැනිදා ඔහුට එරෙහිව පුත්තලම මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ගොනු කර තිබිණි.

   මූලික අයිතිවාසිකම් නඩුව 2022 මාර්තු 08 දින යළි කැඳවීමට නියමිතය.

   මූලාශ්‍රය: https://www.vikalpa.org

3. **ජාත්‍යන්තර මානව හිමිකම් දිනය නිමිත්තෙන් මහනුවර මානව හිමිකම් කාර්යාලය මගින් පැවැත්වීමට නියමිතව තිබූ සමරු රැස්වීම, පොලිසිය අධිකරණයෙන් ලබා ගත් නියෝගයක් මත තහනම් කිරීම.**

   දෙසැම්බර් මස 11 වන දින පැවැත්වීමට නියමිතව පැවති මෙම සැමරුම පැවැත්වුවහොත් 'විවිධ ජාතීන් අතර අසමගියක් ඇති විය හැකි' බවට කරුණු දක්වමින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106 (1) වගන්තිය යටතේ මහනුවර පොලීසිය මහනුවර අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයෙන් මෙම තහනම් නියෝගය ලබාගෙන තිබේ.

   'මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පෙනී සිටිමින් සහ මධ්‍යම පළාත භාර නියෝජ්‍ය පොලිස්පතිතුමන් හමුවෙමින් මෙම මානව හිමිකම් දින සැමරුම හා එහි පසුබිම පිළිබඳව වැඩිදුරටත් තොරතුරු ඉදිරිපත් කළ නමුත් අධිකරණ නියෝගයේ වෙනසක් සිදු නොවූ බැවින්' අදාළ සැමරුම අවලංගු කළ බව ඒ පිළිබඳව දීර්ඝ ලෙස තතු පැහැදිලි කරමින් නිවේදනයක් නිකුත් කරන මහනුවර මානව හිමිකම් කාර්යාලය ප්‍රකාශ කරයි.

   මූලාශ්‍රය: https://sinhala.srilankabrief.org

4. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවේ පසුවන ලංකා ඊ නිව්ස් මාධ්‍යවේදී කීර්ති රත්නායක ජනවාරි 15 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය නියෝග කිරීම.**

   ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයට ප්‍රහාරයක් එල්ල විය හැකි බවට කළ අනතුරු ඇඟවීමක් හේතුවෙන් කීර්ති රත්නායක කොළඹ අපරාධ විමර්ශන ඒකකය මගින් 2021 අගෝස්තු 17 වැනිදා අත්අඩංගුවට ගත් අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ලබාගත් රැඳවුම් නියෝගයක් මත රඳවා සිටී.

   විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින නීතිඥ උපුල් කුමාරප්පෙරුම අධිකරණය ඉදිරියේ කරුණු දක්වමින් තම සේවාදායකයාට එරෙහි චෝදනා පවත්වාගෙන යා නොහැකි බැවින් සැකකරු සියලු චෝදනාවලින් නිදහස් කරන ලෙස ඉල්ලා සිටි අතර මෙම ඉල්ලීම මීළඟ නඩු දිනයේදී කොළඹ කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ විසින් සලකා බැලීමට නියමිතය.

   මෙම අත්අඩංගුවට ගැනීමට එරෙහිව කීර්ති රත්නායක විසින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක්ද ගොනු කර ඇත.

   මූලාශ්‍රය: https://www.dailymirror.lk

5. **තොරතුරු කොමිසමේ නියෝගය ක්‍රියාත්මක නොකළ පොලිස් මූලස්ථානයේ හා පොලිස් අධිකාරී කාර්යාල 03ක නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස තොරතුරු කොමිසම පොලිස් මූලස්ථානයට දැනුම් දීම.**

මාධ්‍යවේදී රාහුල් සමන්ත හෙට්ටිආරච්චි විසින් තොරතුරු කොමිසමට කළ අභියාචනයක (RTIC/Appeal 255/2021) තීන්දුව ප්‍රකාරව අදාළ තොරතුරු ලබා දීම පැහැර හැරීම සම්බන්ධයෙන් තොරතුරු කොමිසම මෙම දැනුම්දීම සිදු කර තිබේ. කොමිෂන් සභාවේ තීරණය ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කර ඒ බව දැනුම් දෙන ලෙසත්, නොඑසේ නම් පනතේ 39/4 වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කරන බවත්, 39(1) ඉ සහ 39(3) වගන්ති ප්‍රකාරව කොමිෂන් සභාවේ නියෝග පැහැරහරින නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් කොමිසමේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සනින් යුත් එම ලිපියෙන් දැනුම් දී තිබේ.

මූලාශ්‍රය: https://ceylonnews24.com

6. **අසභ්‍ය ප්‍රකාශන තහනම් කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව දෙසැ 27 වැනිදා නිකුත් කළ ගැසට් නිවේදනය, අධිකරණ ඇමතිවරයාගේ උපදෙස් පරිදි බල රහිත කිරීම.**

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සනින් යුතුව මේ පිළිබඳව නිකුත් කර ඇති නිවේදනයේ සඳහන් වන්නේ, 2021 දෙසැම්බර් මස 24 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි දෙසැම්බර් 27 වැනිදා ප්‍රකාශයට පත්කළ මෙම ගැසට් නිවේදනය බල රහිත කරන අතර පසුව සංශෝධිත කෙටුම්පතක් අමාත්‍ය මණ්ඩලයට නැවත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව යි.

උක්ත නීතිය ගෙන ඒමට අධිකරණ අමාත්‍යාංශය උනන්දු වූයේ බාලවයස්කාර දරුවන්ගේ සුබසිද්ධිය හා හිංසනයට ලක්වන කාන්තාවන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා කරමින් නීති සකස් කිරීමට මිස භාෂණයේ නිදහට බාධා කිරීම නොවන බව ද එම නිවේදනයේ සඳහන් වෙයි.

සිවිල් සංවිධාන, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, අපරාධ නීති ප්‍රතිසංස්කරණ අනුකමිටුව හා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ අදහස් ලබා ගැනීමෙන් පසු සංශෝධිත කෙටුම්පතක් අමාත්‍ය මණ්ඩලය වෙත යැවීමට කටයුතු කරන ලෙස අමාත්‍යවරයා තමන්ට උපදෙස් ලබා දී ඇතැයි ද අධිකරණ අමාත්‍යාංශ ලේකම්වරයා සිය නිවේදනයෙන් වැඩිදුරටත් කරුණු දක්වා තිබේ.

මූලාශ්‍රය: https://www.lankadeepa.lk

## ව්‍යුහාත්මක කොන්දේසි

**'ව්‍යුහාත්මක කොන්දේසි' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන අවස්ථා 5ක් දෙසැම්බර් මාසයේදී නිරීක්ෂණය විය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගේ අදහස් පළ කිරීම් සම්බන්ධයෙන් ගෙන ඇති නීතිමය පියවර හේතුවෙන් ඔවුන්ගේ අදහස් පළ කිරීමේ නිදහස උල්ලංඝනය වී ඇති බවට අන්තර් පාර්ලිමේන්තු සංගමය විසින් තීරණය කරනු ලැබීම ඒ අතරින් සුවිශේෂ වෙයි.**

**5 වගුව: 2021 දෙසැම්බර්: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 05**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 05 |
| | **එකතුව** | **05** |

1. **රංජන් රාමනායක මන්ත්‍රීවරයා විසින් කරන ලද ප්‍රකාශයක් නිසා ඔහුට සිර දඬුවම් නියම කිරීම හේතුවෙන් ඔහුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව අන්තර් පාර්ලිමේන්තු සංගමය තීරණය කිරීම.**

අධිකරණයට අපහාස කිරීමේ චෝදනාවට වරදකරු කොට සිව් වසරක සිරදඬුවමක් නියම කිරීමෙන් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රංජන් රාමනායකගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව තීරණය කරන අන්තර් පාර්ලිමේන්තු සංගමය ඔහුට ජනාධිපති සමාවක් ප්‍රදානය කරන ලෙස ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටියි.

මෙම නඩුව මූලික නඩු විභාග කිරීමේ නීති සිද්ධාන්ත අනුව විභාග නොවූ බව, එනම් ශ්‍රේෂ්ඨාධිකරණය මගින් එක් අවස්ථාවකදී පමණක් විභාග කරන ලදුව අභියාචනා කිරීමේ අවස්ථාවක්ද නොමැතිව, නීතියේ නිශ්චිතව සටහන් කොට නැති ප්‍රශ්නගත චෝදනාවක් සම්බන්ධයෙන් බරපතළ දඬුවමකට යටත් කොට ඇති බව- එම තීන්දුව මගින් අවධාරණය කර ඇත.

මූලාශ්‍රය: https://www.ipu.org

2. **රිෂාද් බදුර්දීන් මන්ත්‍රීවරයා අත්අඩංගුවට ගැනීම අන්තර් පාර්ලිමේන්තු සංගමයේ දැඩි අවධානයට ලක් වීම.**

රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම පිළිබඳ පසුගිය නොවැම්බර් 30 වැනි දින මැඩ්රිඩ් හි පැවති අන්තර් පාර්ලිමේන්තු සංගමයේ 208 වැනි සැසිවාරයේ දී පුළුල් ලෙස අවධානය යොමු කර ඇති අතර, ඒ පිළිබඳ තීරණ දෙසැම්බර් 16 දා ප්‍රකාශයට පත් කර ඇත.

මන්ත්‍රීවරයා අත්අඩංගුවට ගෙන මාස 6කට අධික කාලයක් රඳවා තබා ගැනීමෙන් පසුවද ඔහුට එරෙහිව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමට පොලිසිය අසමත් වී ඇති බව අවධාරණය කරන එම සංගමය, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පවතින ආකාරයෙන් ක්‍රියාත්මක වීම ගැන කනගාටු වන බවත්, එය සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ ප්‍රතිචාරය අපේක්ෂා කරන බවත් සඳහන් කරයි. මන්ත්‍රීවරයා විසින් ඉදිරිපත් කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට ගැනීම මන්දගාමී වීම ගැනද කනස්සල්ල පළ කර ඇත.

මූලාශ්‍රය: 1. https://www.ipu.org
2. https://theleader.lk

3. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන සිටින සියලුම සිරකරුවන් පිළිබඳව විස්තර ලබා දෙන ලෙස මානව හිමිකම් ක්‍රියාධරයන් පිරිසක් තොරතුරු පනත යටතේ නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටීම.**

මෙම තොරතුරු ඉල්ලීම නීතිපති දෙපාර්තමේන්තුවට භාර දීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් පළ කරමින් මාර්මුත්තු සත්‍යවේල් පියතුමා ජනමාධ්‍ය වෙත ප්‍රකාශ කළේ, සියලු ආගම් නියෝජනය වන සිවිල් සංවිධාන ක්‍රියාධරයන් පිරිසක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ කෲරත්වය පෙන්වමින් නීතිපතිවරයා වෙත ලිපියක්ද භාර දුන් බවයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන දීර්ඝ කාලයක් රඳවාගෙන සිටින සියලු දෙනාට නිදහස ලබා දෙන ලෙස එමගින් ඉල්ලා ඇති බවද පියතුමා සඳහන් කළේය.

මූලාශ්‍රය: https://english.theleader.lk

4. **තොරතුරු කොමිසමේ සභාපතිවරයා ලෙස විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න පත් කිරීමට විරෝධය පළ කරමින් සිවිල් සංවිධාන 9ක් නිවේදනයක් නිකුත් කිරීම.**

ජනාධිපතිවරයා විසින් තොරතුරු කොමිසමේ සභාපති ලෙස පත් කර ලද විනිසුරුවරයා විෂමාචාර චෝදනාවලට ලක් වූ අයෙකු බැවින් එම පත් කිරීම පනතේ අභිලාශයන්ට පටහැනි බවත්, ඔහු අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා ලෙස කටයුතු කිරීම හේතුවෙන් තොරතුරු පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව තොරතුරු කොමිසමේ සභාපතිධුරය දැරීමට නුසුදුස්සකු වන බවත් එමගින් පෙන්වා දී ඇත.

එමෙන්ම අලුතෙන් පත්කර ඇති තොරතුරු කොමිසමේ සංයුතිය 'රටේ සුළු ජාතීන්ට නිසි නියෝජනයක් ලබා දීමට අපොහොසත් වන අතර, එමඟින් සමානාත්මතාවය සහ අන්තර්කරණයේ මූලික මූලධර්ම ආරක්ෂා කිරීමට නොහැකි වන බව' ද පෙන්වා දී තිබේ.

මූලාශ්‍රය: https://srilankabrief.org

5. **ජාතික මානව හිමිකම් කොමිෂන් සභා සඳහා වන එක්සත් ජාතීන්ගේ ආයතනය (GANHRI) විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම A ශ්‍රේණියේ සිට B ශ්‍රේණිය දක්වා පහත හෙළීම.**

එක්සත් ජාතීන්ගේ මහා සමුළුව විසින් 1993 දී සම්මත කරන ලද මානව හිමිකම් කොමිෂන් සභා සඳහා වන පැරිස් මූලධර්ම යටතේ, මෙම තීරණයට එළැඹ ඇති අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනය මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමෙහි ස්වාධීනත්වය අහෝසි කිරීම මෙලෙස තත්වයෙන් පහත හෙළීමට ප්‍රධාන හේතුවක් ලෙස මානව හිමිකම් මහ කොමසාරිස්වරියගේ කාර්යාලය විසින් නිකුත් කරන ලද වාර්තාවෙහි දැක්වේ.

අත්අඩංගුවේදී සිදුවන මරණ සහ වධහිංසා පැමිණවීම් ඇතුළු සියලුම මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ඵලදායී ලෙස කටයුතු කරමින් ප්‍රසිද්ධියේ එම කරුණු ආමන්ත්‍රණය කර නොමැති බවද එමෙන්ම එය සියලු මානව හිමිකම් ප්‍රවර්ධනය කරන සහ ආරක්ෂා කරන ආකාරයෙන් මත දක්වා නැති බවද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට සමාන්තර වාර්තාවක් ඉදිරිපත් නොකළ බවද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමෙහි සංයුතිය ශ්‍රී ලංකා සමාජයේ විවිධත්වය ප්‍රමාණවත් ලෙස සැලකිල්ලට ගෙන නැති බවද වාර්තාව මගින් පෙන්වා දී ඇත.

මූලාශ්‍රය: https://sinhala.srilankabrief.org

## වෘත්තීයවේදීත්වය

**'වෘත්තීයවේදීත්වය' යන්න මාධ්‍ය නිදහසට අදාළව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් හා කර්තෘ මණ්ඩල ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ස්වාධිපත්‍යය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය යන විභව දර්ශක 6ක් මෙම සංරචකයට ඇතුළත් වේ. ඩිජිටල් මාධ්‍යවේදීන් වෘත්තීය වශයෙන් සංවිධානය කිරීම හා එම ක්ෂේත්‍රයේ මාධ්‍යවේදන්ගේ සහභාගීත්වයෙන් ආචාරධර්ම පද්ධතියක් සකස් කිරීම මෙම සංරචකය යටතට ගැනෙන සාධනීය සිදුවීමකි.**

**6 වගුව: 2021 දෙසැම්බර්: වෘත්තීයවේදීත්වය - සිදුවීම් 01**

| අංකය | දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මාධ්‍යවේදීන් හා කර්තෘ මණ්ඩල ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය/ වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ස්වාධිපත්‍යය/ තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය | 01 |
| | **එකතුව** | **01** |

1. **නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මූලිකත්වයෙන් 'ඉහළ වෘත්තීය පරිචයකින් යුත් ඩිජිටල් මාධ්‍යකරණයක් සඳහා වන ආචාරධර්ම උදෙසා මූලික එකඟතාවක් ඇති කර ගැනීම සහ ඩිජිටල් මාධ්‍යවේදීන් සංවිධාන ගත කිරීමේ වැඩපිළිවෙළක්' ආරම්භ කිරීම.**

   නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මූලිකත්වයෙන් 2021 දෙසැම්බර් 15 දින කොළඹදී පැවති ඩිජිටල් මාධ්‍යවේදීන්ගේ අයිතීන් සහ ඩිජිටල් මාධ්‍ය උද්දේශනය පිළිබඳ වැඩමුළුව අවසානයේ දී ඩිජිටල් මාධ්‍යවේදීන් වෘත්තීයමය වශයෙන් සංවිධානගත වීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙළ සැකසීම සහ ගුණාත්මක ඩිජිටල් ජනමාධ්‍යකරණයක් සඳහා වන ආචාරධර්ම පද්ධතියක මූලික එකඟතා ලියවිල්ලක් කෙටුම්පත් කිරීම සිදු කෙරිණි.

   ඩිජිටල් මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන් හා දේශීය භාවිතාවන් පිළිබඳ පුළුල් අධ්‍යනයකින් පසුව සකස් කෙරුණු මෙම එකඟතා ලියවිල්ල පදනම් කරගනිමින් වඩා පුළුල් සහභාගිත්ව ක්‍රියාවලියක් ඔස්සේ ඩිජිටල් මාධ්‍යවේදීන් සඳහා වෘත්තීය ප්‍රතිපත්ති මාලාවක් සහ ආචාරධර්ම සංග්‍රහයක් ප්‍රකාශයට පත් කිරීම ඉදිරියේදී තුළ සිදු කිරීමට නියමිතය.

   ඩිජිටල් මාධ්‍යවේදීන්ගේ වෘත්තීය එකමුතුවක් පිහිටුවීම සඳහා තාවකාලික නිලධාරී මණ්ඩලයක්ද පත් කරගන්නා ලදි.

**7 වගුව: මාධ්‍ය නිදහස: 2021 ජනවාරි - නොවැම්බර් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්**

| ආවරණය කර ඇති සංරචකය | 2021 ජනවාරි - නොවැම්බර් | | 2021 දෙසැම්බර් |
|---|---|---|---|
| | පෙර සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 37 | | 03 |
| නීතිමය කොන්දේසි | 37 | 10 | 06 |
| මාධ්‍ය ස්වාධීනත්වය | 02 | | 01 |
| මාධ්‍ය නිදහස සම්බන්ධ ප්‍රවණතා | 01 | | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 06 | | 05 |
| වෘත්තීයවේදීත්වය | 01 | | 01 |
| **එකතුව** | **83** | **10** | **16** |

2021 මාධ්‍ය නිදහස මාසික වාර්තා ජනවාරි-නොවැම්බර් දක්වා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


## Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25